**මහරගම නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

**--------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 25 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 21 දින සභාවේ ලේකම්වරයා වෙත යවා ඇත.

### 1.2 මතය ව්‍යාචනය

**-----------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**-------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**---------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වියදම් වෙනුවෙන් ණයහිමි වෙන්කිරීම් සිදු නොකිරීම හේතුවෙන් වියදම් හා ණයහිමියෝ රු. 429,159 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) රුක්මලේ ෂෙල්ටන් පාර්ක් පාරේ ඉතිරිකොටස කොන්ක්‍රීට් කිරිම වෙනුවෙන් රු.215,783ක් ණයහිමියන් සඳහා වෙන්කර තිබුණ ද 2015 ජුලි 17 දින වන විට සියළු ගෙවීම් ගෙවා අවසන් කර තිබූ බැවින් වියදම් සහ ණය හිමියෝ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) මහරගම වෙළඳ සංකීර්ණයේ වහලය අළුත්වැඩියාව සඳහා 2015 දෙසැම්බර් 31 දිනට රු.485,000 ක් ණයහිමියන් ලෙස වෙන්කර තිබුණ ද එම කොන්ත්‍රාත්තුව ඉටුකර නොතිබූ බැවින් වියදම් සහ ණය හිමියෝ එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ දී සභාව විසින් රු. 5,300,000 ක් වටිනා මාර්ග තලනය රු.530,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර තිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායක වීමේ ගිණුමේ ශේෂය රු. 4,770,000 ක් අඩුවෙන් දක්වා ඇති බව විගණන වාර්තාව මගින් පෙන්වා දී තිබුණ ද එය නිවැරදි කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ද ස්ථාවර වත්කම් ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු. 4,770,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා නගරසභා ආඥාපනතේ 181 (1) වගන්තිය ප්‍රකාරව ගණනය කරන ලද රු. 9,143,457 ක් වූ විගණන ගාස්තු 2016 අප්‍රේල් 30 දින වන විටත් ගෙවා

නොතිබූ අතර 2015 වර්ෂයට ගෙවිය යුතු විගණන ගාස්තු වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන වෙන්කර නොතිබුණි.

(ඊ) 2015 වර්ෂයේ දී පරිත්‍යාග වශයෙන් ලැබුණු කසල ප්‍රවාහනය සඳහා යොදාගන්නා ට්‍රක් රථයේ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය තුළ දී කපා හැර තිබූ රු. 13,026,902 ක් වූ වියදම් ණය හිමි ශේෂයට සාවද්‍ය ලෙස රු.801,229 ක් වූ ගබඩා ණය හිමියන් ද ඇතුලත් කර තිබුණි.ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට වියදම් ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද ගබඩා ණයහිමියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද ගිණුම්වල දක්වා තිබුණි.

(ඌ) 2015 වර්ෂයට අදාලව ලැබුණු රු.1,703,809 ක ගලිබවුසර් සේවා ආදායම තැන්පතු ගිණුමට ඇතුලත් කර තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු. 1,703,809 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(එ) 2015 වර්ෂය සඳහා ලැබිය යුතු රු.35,824,699 ක වැටුප් ප්‍රතිපූර්ණ ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බැංකු අයිරාවක් ලෙස රු. 47,867,854 ක් ගිණුම්වල දක්වා තිබුණු නමුත් සත්‍ය වශයෙන් එවැනි බැංකු අයිරාවක් නොපැවති බවත් එම ගිණුම 2015 අගෝස්තු 25 දින වසා දමා තිබූ බවත් බැංකු ශේෂ තහවුරුව මගින් සනාථ විය. එම හේතුවෙන් ගිණුම්වල ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඔ) 2013 වර්ෂය වෙනුවෙන් ලැබුණු රු. 90,585,570 ක හිඟ මුද්දර බදු ආදායමක් සමාලෝචිත වසරේ ආදායමක් ලෙස ගිණුම් තැබීම නිසා වර්ෂයේ ආදායම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්

------------------------

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.118,044,934 ක් වූ ගිණුම් විෂයයන් 6 කට අදාල ශේෂයන්, ඒවාට අදාල උපලේඛනවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී, මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් රු.196,513 ක් ද, වැඩියෙන් දැක්වීම් රු.3,304,409 ක් ද නිරීක්ෂණය විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

---------------------------------

විවිධ තැන්පත්, අත්තිකාරම් හා ලැබිය යුතු ගිණුම් විෂයන්ට අදාලව එකතු වටිනාකම රු.119,686,578 ක් සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකළ අතර වෙනත් විගණන ක්‍රියාපටිපාටි මගින්ද මෙම ශේෂවල නිවරුදිභාවය තහවුරුකර ගැනීමට නොහැකි විය.

### 1.3.4 අවිනිශ්චිත ගිණුම්

-----------------

වසර ගණනාවක සිට පැවත එන රු. 25,781 ක් වූ අවිනිශ්චිත ගිණුමට අදාල ශේෂය පිළිබඳ සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

(අ) ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.88,994,545 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු.48,086,862 ක් විය.

(ආ) විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2015 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා සභාවේ ප්‍රාග්ධන ආදායම් හා වියදම් ගැලපීමෙන් පසු ශුද්ධ ඌණතාවය රු.51,285,198 ක් වූ අතර සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් බාදනය වී තිබුණි.

### 2.2 බැංකු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ,188 (2) විධිවිධාන ප්‍රකාරව 2016 මාර්තු 31 දිනට වටිනාකම රු. 13,907 ක් වූ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ චෙක්පත් 02 ක් හා මුදල් ඇණවුම් 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 395 (ඇ) විධිවිධාන ප්‍රකාරව බැංකු ගිණුම්වල එක් එක් මාසය අවසානයේ දී ඇති ගණුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊලඟ මාසයේ 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවත්, එක් ජංගම ගිණුමකට අදාලව 2014 හා 2015 වර්ෂ සඳහා බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 396 විධිවිධාන ප්‍රකාරව නිකුත්කර මාස 06 ක කාලයක් ඉකුත් වූ එකතුව රු.177,323 ක් වටිනා චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව සභාපතිවරයා විසින් ඉදිරිපත් කර තිබුණු තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ සාරාංශගත තොරතුරු පහත දැක්වේ.

| | 2015 | 2014 |
|---|---|---|

| ආදායම් විෂයය | තථ්‍ය අයකරගත යුතු | තථ්‍ය අයකර ගත් | වර්ෂයට හිඟය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | තථ්‍යඅයකර ගත යුතු මුදල | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 90,718 | 53,138 | 37,580 | 74,306 | 84,256 | 76,246 |
| බදු කුලී | 18,520 | 14,553 | 3,967 | 17,376 | 20,671 | 27,046 |
| බලපත්‍ර ගාස්තු | 1,002 | 1,002 | - | 18 | 833 | 29 |
| වෙනත් ආදායම් | 258,007 | 126,812 | 131,195 | 162,209 | 182,845 | 124,914 |
| | 368,247 | 195,505 | 172,742 | 253,909 | 288,605 | 228,235 |

**2.3.2 වරිපනම් බදු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් හා බදු ආදායම ලෙස රු.90,717,876 ක මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එයින් 2015 දෙසැම්බර් 31 දිනට රු.37,579,947 ක් අයවිය යුතුව තිබුණි.

(ආ) 2015 දෙසැම්බර් 31 දිනට මුළු වරිපනම් බදු හිඟය රු.72,501,617 ක් වූ අතර එයින් රු.50,000 ත් රු.100,000 ක් අතර හිඟ වරිපනම් බදු ශේෂය රු.2,796,570 ක් හෙවත් මුළු හිඟයෙන් සියයට 4ක් විය.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය තුළ රු.100,000ට වැඩි හිඟ වරිපනම් බදු ඒකක 18 ක් පැවති අතර එකතු හිඟ වටිනාකම රු.4,015,888 ක් විය.

(ඈ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.76,245,719 ක සමුච්චිත හිඟ වරිපනම් බදු මුදලින් 2015 දෙසැම්බර් 31 දින වන විට රු. 44,900,208 ක් අයවිය යුතුව තිබුණි.

**2.3.3 බදු කුලී**

(අ) 2015 දෙසැම්බර් 31 දිනට කඩකුලී උපලේඛන අනුව රු.16,537,552 ක් ද මස් වෙළඳසැල් ආදායම් ලේඛන අනුව රු.838,270 ක් ද ලැබිය යුතුව තිබුණ ද එම මුදල් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු.25,319,300 ක හිඟ කඩකුලී ආදායමෙන් 2015 දෙසැම්බර් 31 දින වන විට රු. 19,021,523 ක් අයවිය යුතුව තිබුණි.

## 2.3.4 ඉඩම් වෙන්දේසි බදු

---------------------

නගර සභා ආඥාපනතේ (255 අධිකාරියේ)165 "ඇ"උපවගන්තිය ප්‍රකාරව නගර සභාවක පාලන සීමා තුළ පිහිටි යම් ඉඩමක් වෙන්දේසිකරුවකු විසින් හෝ බ්‍රෝකර්කෙනෙකු විසින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ හෝ වෙනත් යම් ආකාරයකින් විකුණනු ලැබුවහොත්, ඒ විකුණුම් වටිනාකමින් සියයට 1 කට සමාන බද්දක් විකුණුම්කරු විසින් සභාවට ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ සිදු කරනු ලැබූ ඉඩම් විකුණුම් 13 කින් සභාව විසින් අය කර තිබුණේ ආදායම් පරීක්ෂකවරයා විසින් ඇස්තමේන්තු කර තිබූ විකුණුම් වටිනාකමින් සියයට 1 ක් වූ රු. 4,027,883ක්පමණි.මෙම ඇස්තමේන්තු වටිනාකම හා ඉඩම් කොටස්වල සත්‍ය විකුණුම් වටිනාකම අතර වෙනස සොයා බලා එම වෙනස අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. විකුණුම් වටිනාකමින් සියයට 1 කට සමාන බද්දක් විකුණුම්කරු විසින් සභාවට ගෙවිය යුතු වුවත් ඊට පටහැනිව ගැනුම්කරුගෙන් රු.37,500 ක බදු මුදලක් සභාව අයකරගෙන තිබූ බව විගණන නියැදි පරීක්ෂාවේ දී අනාවරණය විය.

## 2.3.5 දැන්වීම් පුවරු ගාස්තු

----------------------

2014 නොවැම්බර් 28 දිනැති අංක 1891දරන මහරගම නගර සභාවේ සභාපතිවරයාගේ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනයේ දක්වා ඇති නිවේදනයට අනුව මහරගම නගර සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීම් පුවරු සඳහා එහි දක්වා ඇති පරිදි ගාස්තු අයකළ යුතු වුවද සභා බල ප්‍රදේශය තුළ සිදු කළ නියැදි භෞතික පරීක්ෂාවලදී නිරීක්ෂණය වූ පරිදි ස්ථාවර දැන්වීම් පුවරු 16 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළරු.370,500 ක් දැන්වීම් පුවරු ගාස්තු අයකර ගෙන නොතිබුණි.

# 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------

## 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

-------------------------

එක් කාර්යයක් වෙනුවෙන් ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීමෙන් පසුව පමණක් වෙනත් අත්තිකාරමක් ලබාදීම කල යුතු වුවද කලින් ලබාගත් අත්තිකාරම් නොපියවා තිබිය දී එම නිලධාරියා වෙත නැවත අත්තිකාරම් ලබාදී තිබුණි.

## 3.2 සේවක ණය

-------------

(i) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව අයවිය යුතුව තිබුණු සේවක ණය ශේෂය රු.26,443,244 ක් වූ අතර, එම ශේෂය තුළ සේවය හැර ගිය, ස්ථාන මාරු වී ගිය හා මිය ගිය සේවකයන්ගෙන් දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පවතින රු.349,590 ක් වූ ශේෂයක් ද ඇතුලත් විය.

(ii) සේවකයන් 5 දෙනෙකුගේ රු. 147,115 ක් වූ විවිධ ණය ශේෂයන්ගෙන් කිසිදු ණය වාරිකයක් සමාලෝචිත වර්ෂය තුළ දී අයකරගෙන නොතිබුණි.

## 3.3 අවිධිමත් ගනුදෙනු

------------------

සහා බල ප්‍රදේශය තුළ කසළ ඉවත් කිරීම සඳහා පෞද්ගලික ටිපර් රථ කුලී පදනම මත ලබා ගැනීමේ දී මිල ගණන් කැඳවීමකින් තොරව පෙර වර්ෂයේ ලබාගත් මිල ගණන්වලටම කුලියට ලබාගෙන තිබුණු අතර ඒ සඳහා ගිවිසුම් ගත වී නොතිබුණි. එම ටිපර් රථ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.1,550,000 ක මුදලක් කුලී වශයෙන් ගෙවා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ දී ටිපර් රථ වෙනුවෙන් ගෙවීම් කිරීමේ දී අදාල සේවාව සිදු නොකළ දින 11 ක් වෙනුවෙන් රු.85,250 ක් ගෙවා තිබුණි.

**3.4 හඳුනා ගත් අලාභ**

(අ) සමාලෝචිත වර්ෂය තුළ අනතුරු 02 කට ලක් වී තිබූ වාහන අළුත්වැඩියා කිරීම සඳහා සභාව විසින් රු.128,513 ක මුදලක් වැය කර තිබුණ ද, එම අනතුරු සඳහා වගකිවයුත්තන් නිශ්චය කිරීමටත් අලාභ අදාල වගකිවයුත්තන්ගෙන් අයකර ගැනීමටත් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 103,104 සහ 105 පරිදි සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 1999 වර්ෂයේ සිට 2010 දක්වා වූ කාල සීමාව තුළ සාමාජිකයින් 355 ක් විසින් භාර නොදුන් රු.112,148 ක් වටිනා පුස්තකාල පොත් 558 ක් සම්බන්ධයෙන් සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සභාව සතු ට්‍රේලර් යන්ත්‍ර දෙකක් සභාවේ භෞතිකව නොමැති බව නිරීක්ෂණය වී තිබුණි. මෙම ට්‍රේලර් යන්ත්‍ර දෙක ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුලත් කර තිබුණ ද වටිනාකම ඇතුලත් කර නොතිබුණි.

**3.5 කොන්ත්‍රාත් පරිපාලනය**

**3.5.1 ප්‍රමාද වූ ව්‍යාපෘති**

(අ) සමාලෝචිත වර්ෂයේ සහා බලප්‍රදේශය තුළ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති 366 ක් වෙනුවෙන් ගිවිසුම් ගත වී තිබූ අතර ව්‍යාපෘති 314 ක වැඩ අවසන්කර තිබුණි. ව්‍යාපෘති 41 ක් නොනිමි තත්ත්වයේ තිබූ අතර සභා අරමුදල් යටතේ වූ ව්‍යාපෘති 11 ක් අවලංගු කර තිබුණි.

(ආ) සභාව විසින් ව්‍යාපෘති 04 ක් සඳහා 2014 සහ 2015 වර්ෂවලදි ගිවිසුම් අත්සන් කර තිබුණද විගණිත දිනය වූ 2016 මැයි 06 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

3.5.2 **මහරගම සතිපොල පවිත්‍රතා සේවාව**

මහරගම සතිපොළ භූමියේ පවිත්‍රතා කටයුතු ඉටු කිරීමේ කොන්ත්‍රාත්තුව 2015 මැයි 09 දින සිට පෞද්ගලික සමාගමකට පවරා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ටෙන්ඩර් කැඳවීමේ දී මේ සඳහා මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන 4 ක් අතරින් සලකා බලනු ලැබූ අඩුමිල දන්වා තිබූ ටෙන්ඩරය ප්‍රතික්ෂේප කර වැඩිමිල ටෙන්ඩර්කරු තෝරාගෙන තිබුණි.

(ii) අඩුම්ල ටෙන්ඩර්කරු ප්‍රතික්ෂේප කර තිබුණේ පොළ පැවැත්වෙන දිනවල පමණක් පිරිසිදු කටයුතු සිදුකරන බව දක්වා තිබීම නිසා බැව් ප්‍රකාශ වුවත් ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමේ දී අවශ්‍යතාවය කුමක් ද යන්න පැහැදිලිව දක්වා නොතිබුණි.

(iii) කොන්ත්‍රාත්කරුට ඒ සඳහා ගෙවීම් කිරීමේ දී ගිවිසුමට අනුව මසකට ගමන් වාර 13 ඉක්මවා වැඩිවන ගමන්වාර වෙනුවෙන් අතිරේකව රු. 6,000 බැගින් ගෙවා තිබුණි. අඩුම්ල ඉදිරිපත් කර තිබූ ප්‍රතික්ෂේපිත ටෙන්ඩර්කරු සිය මිල ගණන් ඉදිරිපත් කිරීමේ දී කසල ඉවත් කිරීම සඳහා කම්පැක්ටර් රථ සහ ටිපර් යොදා ගන්නා බවට වූ වගන්තිය ටෙන්ඩර් මණ්ඩලය සැලකිල්ලට ලක්කරන ලද්දේ නම් මෙම අතිරේක ගෙවීම් වලක්වාගත හැකිව තිබිණි. තෝරා ගත් කොන්ත්‍රාත්කරු කසල බැහැර කිරීම සඳහා ට්‍රැක්ටර් රථ පමණක් යොදා ගෙන තිබුණි.

(iv) අදාල කාර්යය ඉටු කිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම් ගත වී තිබුණේ 2015 ජූලි 15 දින සිට වුවත් ඊට පෙර එනම් 2015 මැයි 09 දින සිටම කොන්ත්‍රාත්කරු කසල බැහැර කිරීමේ කටයුතු ඉටුකර තිබුණු අතර එම කාල සීමාව සඳහා ගෙවීම් කර තිබුණි. එසේ වුවද සතිපොළ භූමිය වෙළඳ කටයුතු සඳහා ලබා දී තිබුණේ 2015 ජූනි මස 27 දින සිට බැව් විගණනයේ දී අනාවරණය විය.

(v) මහරගම සතිපොල පරිශ්‍රය පවිත්‍ර කිරීමේ කාර්යය සඳහා පෞද්ගලික සමාගමක් සමඟ එළඹ තිබූ ගිවිසුමට අනුව 2015 මැයි මාසයේ සිට 2015 දෙසැම්බර් මාසය දක්වා වූ කාලසීමාව සඳහා පවිත්‍ර කිරීමේ ගාස්තු වශයෙන් රු. 2,660,019 ක් ගෙවා තිබුණ ද එම කාලසීමාව සඳහා පොල බදු ආදායම් ලෙස ලැබී තිබුණේ රු.1,833,287 ක් පමණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

## 4.1 අයවැය පාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වර්ෂය තුළදී ආදායම් හා වියදම් ශීර්ෂ අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුවද අයවැයගත හා තථ්‍ය, ආදායම් අතර සියයට 3 සිට සියයට 100 දක්වා ද අයවැයගත හා තථ්‍ය වියදම් වල සියයට 7 සිට සියයට 82 දක්වා ද විචලනයන් පැවතුණු අවස්ථා 17 ක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

(ආ) සභාව විසින් 2015 වර්ෂයේ ප්‍රාග්ධන ලැබීම් ලෙස රු.416,000,000 ක් ඇස්තමේන්තු කළද, සත්‍ය වශයෙන් ලැබී තිබුණේ රු.1,348,539 ක් හෙවත් සියයට 0.3 ක් පමණි.

(ඇ) වියදම් විෂයන් 114 ක අයවැයගත කර තිබූ රු.146,352,500 ක මුදලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඈ) ආදායම් ශීර්ෂ 07 ක් යටතේ ආදායම් විෂයන් 18 ක් සඳහා ඇස්තමේන්තු කර තිබූ රු.537,926,500 ක ආදායම්වලින් සමාලෝචිත වර්ෂය තුළ කිසිදු ආදායමක් එකතු කර නොතිබුණි.

## 4.2 අභ්‍යන්තර විගණනය

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ.133 (1) සහ (2) හි දැක්වෙන විධිවිධාන පරිදි අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සංවිධානය කරගෙන නොතිබුණි.

**4.3** **වත්කම් කළමණාකරණය**

**------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

**----------------------------**

ගරාජය , සෞඛ්‍ය අංශය , මාර්ග අංශය හා පොදු වෙළඳ සැල අංශයන්හි ඉන්වෙන්ට්‍රි ලේඛන පවත්වා නොමැති බව 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව අනාවරණය විය.

**5.** **පද්ධති හා පාලන**

**-----------------**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) අභ්‍යන්තර විගණනය
(ආ) අයවැය පාලනය
(ඇ) ගිණුම්කරණය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) ණයගැති, ණයහිමි පාලනය